# මානව සංස්කෘතියේ ත්‍රිත්ව සුසමාදර්ශක සංදර්භය

## පෞරාණික - නූතනවාදී සිනමාවක සංකල්පීය ශක්‍යතාව

**ආචාර්ය ටියුඩර් වීරසිංහ**

19 වන සියවස තුළ සිනමාවේ බිහිවීම සහ එහි පරිණාමනීය ගමන් මග ආරම්භ වූ අතර එය විශේෂයෙන් ම යුරෝපා සංස්කෘතියේ සහ තාක්‍ෂණික පරිණාමයේ ප්‍රතිඵලයකි. සම්භවය අනුව සිනමාව බටහිරවාදී සංස්කෘතියේ සංඝටකයකි. ආරම්භක අවධියේ දී සිනමාව බටහිර - යුරෝපීය සංස්කෘතියේ විශේෂයෙන් සාහිත්‍යයේ දැවැන්ත බලපෑම් යටතේ වර්ධනය විය. දෙවැනි ලෝක සංග්‍රාමයෙන් අනතුරුව යුරෝපීය සංස්කෘතියේ සම්ප්‍රදායන් පවත්වාගෙන යෑමේ ප්‍රභාවත් ම අවධිය සනිටුහන් කළ අතර, ඉන්පසුව එය ශීඝ්‍ර ලෙස බටහිරකරණයට විශේෂයෙන් හොලිවුඩකරණයට ලක්වීම ආරම්භ විය. (Zinovyew 1995) සිනමාකරණයේ නිෂ්පාදන බලවේග සහ ඊට සම්බන්ධ තාක්‍ෂණික සහ තාක්‍ෂණවේද පද්ධතිය අසාමාන්‍ය ලෙස වර්ධනය වන්නට වූ අතර ක්‍රමානුකූලව එය විවිධ ජාතික සංස්කෘතීන්හි කොටසක් බවට පත්ව, ඉන් අනතුරුව එය ගෝලීය ප්‍රපංචයක් බවට පත්විය. එසේ ම සිනමා සියලු කලා මාධ්‍යයන් අබිබවා ප්‍රමුඛ කලා මාධ්‍ය බවට පත්වූවා පමණක් නොව එය සෙසු කලා ප්‍රභේදයන් කෙරෙහි බලපෑමක් ද සිදු කළේ ය. මෙහි දී බටහිර යුරෝපා කලාවේ මූලික සහ වැදගත් දේ ලෙස සලකන ලද චිත්‍රපටවල හරය, අන්තර්ගතය මෙන් ම කලාවේ මූලික ලක්‍ෂණ සිනමාව අහිමි කරගත් අතර බටහිරවාදී බොහෝ විචාරකයින් මේ තත්වය ප්‍රතිකලාව ලෙස හඳුන්වන්නට විය. හරසුන්භාවය, නිරාචාරිත්වය, විපරීතතාව, සල්ලාලකම, දුෂ්ටභාවය, දූරාචාරය, ප්‍රචණ්ඩත්වය, අදහස්මය දිළිඳුකම, කාලකණ්ණිකම, භාවාත්මක ප්‍රාථමිකවාදය, යථාර්ථයෙන් පළායාම සහ එය විකෘති කිරීම ආදි බටහිර යුරෝපීය සංස්කෘතියේ දෝෂාරෝපණයට සහ විවේචනයට ලක්වන බොහෝ දෑ බටහිර සිනමාවේ ලක්ෂණ බවට පත්විය. ඉහළ බුද්ධිමය, සදාචාරාත්මක, කලාත්මක සහ සෞන්දර්යාත්මක චිත්‍රපට බිහිවීම කලාතුරකින් සිදු වන සංසිද්ධියක් බවට පත්විය. වසරකට 25 - 30 පමණ වන ශ්‍රී ලාංකේය වාර්ෂික චිත්‍රපට නිෂ්පාදනය තුළ එම තත්වය සහ ප්‍රවණතාව ම දක්නට ලැබෙන බව පෙන්වා දිය යුතු ය.

වර්තමානයේ ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල සිනමාව පමණක් නොව සමස්තයක් වශයෙන් ගෝලීය සිනමාව ද පිරිහි ඇති බවටත් පසුබා ඇති බවටත් නිරතුරුව චෝදනා නැගෙන බව ප්‍රකට ය. දාසයක හය හතක පමණ කාලයකින් සිනමාව සියලු ම රටවල, ජාතීන්ගේ ජනවර්ගවල, සමාජ පන්තිවල, වෘත්තිකයින්ගේ, විවිධ වයස් පරතරවල සහ විවිධ මනෝභාවයන් සහිත මිනිසුන්ගේ හදවත් සහ බුද්ධිය අත්පත් කර ගනිමින් මානව වර්ගයාගේ දෛනික පැවැත්මේ බුද්ධිමය සහ අධ්‍යාත්මික ජීවිතයේ අවියෝජනීය කොටසක් බවට පත් වී තිබිණ. මෙම පත්‍රිකාවේ මූලික අරමුණ වන්නේ බටහිර යුරෝපා සංස්කෘතිය තුළ බිහි වී දශක කීපයක් උසස් ගුණාත්මක භාවයක් මෙන් ම ඉහළ බුද්ධිමය සදාචාරාත්මක සහ කලාත්මක සෞන්දර්ය වටිනාකම් ලෝක සංස්කෘතියට කලාව දායක කළ සිනමාව, 20 වන සියවස අවසානය වන

විට ඊට ආවේණික වූ සම්භාව්‍ය ගුණාංග සහ වටිනාකම් හැඩි කරගෙන පරිණාමිය පත්වීමට බලපාන ලද හේතු සහ සාධක සොයා බැලීමත් ශ්‍රී ලාංකේය සිනමා සංස්කෘතියට අදාළව එම හේතු සාධකවල බලපෑම ලද ආකාරය, මේ තත්වය ජයගැනීම අරබයා පෞරාණික හා නූතනවාදී සිනමාවක න්‍යායික සංකල්පීය ශක්‍යතාව ගවේෂණය කිරීමත් ය.

මෙම ගවේෂණය සඳහා න්‍යායික ක්‍රමවේද පදනම් ලෙස මානව වර්ගයාගේ චින්තනයේ පරිණාමයේ ත්‍රිත්ව සුසමාදර්ශකය යොදාගැනීමට වඩාත් උචිත බව හැඟේ. මෙම ත්‍රිත්ව සුසමාදර්ශකය මගින් අදහස් වන්නේ සමස්ත මානව වර්ගයාගේ සමාජ පරිණාමය මූලික යුග ත්‍රිත්වයක් වන පූර්ව නූතන යුගය, නූතන යුගය සහ පශ්චාත් නූතන යුගය වශයෙන් වෙන් කොට, ඊට සමරූපීව මානව චින්තනයේ පරිණාමය ද පූර්ව නූතන සහ පශ්චාත් නූතන ලෙස සලකා බැලීමයි.

අප ජීවත් වන සමාජය මූලික වශයෙන් ප්‍රධාන පැතිකඩ තුනකට බෙදා දැක්විය හැකි ය. ඉන් එක් පැතිකඩක් වන්නේ, පුද්ගලයාගේ සහ සමාජයේ ජීව පැවැත්ම සහතික කරන්නා වූ ද්‍රව්‍යමය පරිභෝජන වටිනාකම් නිෂ්පාදනය කිරීමේ මාදිලිය වන ආර්ථික යි. දෙවැනි පැතිකඩ වන්නේ, බල පාලනමය සහ ප්‍රජාමූලවාදී සම්බන්ධතා ඒකීය සමාජයක් ලෙස පාලනය කරන දේශපාලන ක්‍රියාවලිය සංයුක්ත කරන්නා වූ රාජ්‍ය පැතිකඩ වන අතර, තුන්වැනි පැතිකඩ වන්නේ සමාජයෙහි ජීවත් වන විවිධ පුද්ගල කණ්ඩායම්වල විවිධාකාර වූ අදහස් මත, සංවේදිතා ආදිය මගින් සංයුක්ත කරන සමාජයේ මානසිකත්ව පැතිකඩ ය. මෙම සමාජයේ මානසිකත්ව පැතිකඩ අදාළ සමාජයේ දෘෂ්ටිවාදය මගින් ප්‍රකට වන්නේ ය. පුළුල් අර්ථයෙන් ගත් කල ඊට ජන විඥානය, සමාජ විඥානය, සංහතික විඥානය හැඩගස්වන්නා වූ සියලු සමාජ විඥානික ස්වරූප හා මාධ්‍ය ඇතුළත් වන්නේ ය. නිදර්ශනයක් ලෙස පුරාණෝක්තිය, ආගම, දර්ශනවාදය, විද්‍යාව, කලාව, නීතිය, සදාචාරය, දේශපාලනය චිත්‍ර කලාව, මූර්ති කලාව, නර්තනය, රංගනය, සංගීතය, පුවත්පත්, සඟරා, ගුවන් විදුලිය, සිනමාව, රූපවාහිනිය සමාජ මාධ්‍ය ආදී තවත් බොහෝ දෑ දැක්විය හැකි ය.

මානව සමාජයේ සහ චින්තනයේ පරිණාමීය සුසමාදර්ශක ත්‍රිත්වයට සමාන්තරව මානව සමාජයේ පරිණාමය ගුණාත්මක වශයෙන් වෙනස් 'මානව ඒකාබද්ධ' තල මට්ටම් ත්‍රිත්වයක් ද පෙන්වා දිය හැකිය. ඒවා පූර්ව සමාජ තලය, සමාජ තලය සහ උපරි සමාජ තලය ලෙස හැඳින්විය හැකි ය. (Zinovyew 2008)

අප ඉහත ගෙන හැර දක්වන ලද සමාජයේ පැතිකඩ ත්‍රිත්වය වර්තමානයේ ඒකීය සමස්තයක් ලෙස ක්‍රියාත්මක වන බව පෙන්වා දිය යුතු ය. සමාජයෙහි මානසිකත්ව පැතිකඩෙහි සංවිධානාත්මක සහ මෙහෙයුම්කාරක ස්වරූපය ලෙස දෘෂ්ටිවාදය ක්‍රියාත්මක වන අතර, ඊට අද්‍යතන සමාජයෙහි සුවිශේෂී අවධානයක් සහ ස්ථානයක් හිමි වන්නේ ය. එය අනෙක් ද්වි පැතිකඩ පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය කොන්දේසියක් බවට පත් වී තිබේ.

එසේ ම ඒ ඒ සමාජවල මානව ද්‍රව්‍ය හැඩගැස්වීම සඳහාත්, එය අදාළ සමාජ සංවිධාන රටාවට අනුව පවත්වාගෙන යාම සඳහාත්, අදාළ සමාජයෙහි බල හා පාලන සම්බන්ධතා ස්ථාවර ලෙස පවත්වාගෙන යාම සඳහාත්, ආර්ථික සහ පාරිභෝජන චින්තනය අඛණ්ඩව ප්‍රවර්ධනය කිරීම සඳහාත් සමකාලීන සමාජ සහ උපරි සමාජවලට සිනමාව ඇතුළු සංහතික විඥාපන මාධ්‍ය අත්‍යවශ්‍ය සාධකයකි. එම සමාජීය අවශ්‍යතා ඒ ඒ සමාජවල විශේෂතාවලට යටත්ව පවත්වාගෙන යාමේ දී එය සිනමාවේ ගුණාත්මක තත්වය කෙරෙහි ඍජුව හෝ වක්‍රව බලපෑනු ලැබේ.

20 වැනි සියවස ප්‍රථම භාගය සහ විශේෂයෙන්ම 20 වැනි සියවසේ අපර භාගයේ දී මානව සංහතිය සිය සමාජ පරිණාමයේ උපරි සමාජ අවධියට අවතීර්ණ වූ අතර එම අලුත් සමාජය තුළ පෙර සමාජ අවධිය තුළ නොවූ ආයතන, සම්බන්ධතා, ගුණයන් වර්ධනය විය. ඒ අතර පෙර සමාජ අවධියෙහි වූ

බොහෝ සංරචක බහිෂ්කරණාත්මකව හෝ නිලීනාත්මකව උපරි සමාජ අවධියට ඇතුළත් විය. කලාව සහ සිනමාව සම්බන්ධව ද එය එසේ ම විය. නිදර්ශනයක් ලෙස දෙවැනි ලෝක සංග්‍රාමයෙන් පසුව ලෝක සිනමාවේ ස්වර්ණමය යුගය උදා වූ අතර, ඉන් අනතුරුව එය මානව වර්ගයාගේ සමාජීය තලයෙහි අර්ථමය පරිහානියට ලක්වීමේ ප්‍රවණතාව මතුවිය. ලෝක කලාව, සිනමාව තුළ ඇතිවූ මෙම ලාක්ෂණික ප්‍රවණතාව බටහිරවාදී සංස්කෘතික විචාරකයින් ප්‍රතිකලාව ලෙස හැඳින්වූ අතර ඇත්ත වශයෙන් ම මෙම ප්‍රපංචයේ යථාර්ථය, හරය වූයේ සිනමාව ඇතුළු මානව සංස්කෘතික, කලා නිර්මාණ උපරි සමාජතලය තුළ සිය පරිණාමයේ පශ්චාත් තත්වයකට ගමන් කිරීමයි.

සිනමාවේ ආරම්භය සනිටුහන් කරමින් 1895 දෙසැම්බර් 28 වන දින පැරිස් නුවර දී ලුමියර් සහෝදරයින් එයින් ප්‍රදර්ශනය කරන ලද චිත්‍රපට කිහිපයක් සති කිහියකින් රෝමය, වියානා, බර්ලින්, ශාන්ත පීටර්ස්බර්ග්, මොස්කව් වැනි නගරවල ප්‍රදර්ශනය කළ අතර ඉන් අනතුරුව ලුමියර් සහෝදරයින්ගේ චිත්‍රපට ඉන්දියාව, ඕස්ට්‍රේලියාවට ඊජිප්තුවට ආදී වශයෙන් ලොව පුරා ව්‍යාප්ත විය. මාස කීපයක් ගත වන විට යුරෝපා රටවල විශාල ප්‍රමාණයකින් සිනමාවේදින් බිහි වන්නට විය. 20 වැනි සියවස ආරම්භයේ දී ම යුරෝපය සියලු ම සංවර්ධිත රටවල ද ඇමරිකාවේ ද, අසියාවේ ද, අප්‍රිකාවේ ද ස්වකීය ජාතික මට්ටමේ චිත්‍රපට නිෂ්පාදනය ආරම්භ විය. 20 වැනි සියවසේ ප්‍රථම සහ දෙවැනි දසකවල දී සිනමාව සිය අනුකරණාත්මක හැකියාවෙන් ඔබ්බට ගොස් ජීවිතය සමග තමන්ට ම අනන්‍ය වූ ප්‍රකාශනාත්මක ලක්ෂණ අත්පත් කර ගත්තේ ය.

සිනමාව තරම් වේගයෙන් ලොව පුරා ව්‍යාප්ත වූ වෙනත් කලා ප්‍රභේදයක් මානව වර්ගයාගේ ඉතිහාසයෙහි නැත. සිනමාවේදය බිහිවී දැනට වසර 120 ක් පමණ වන අතර සිනමා කලාව බිහිවී වසර 100 පමණ ගෙවී ගොස් ඇත. මේ කාලය තුළ සිනමාව මානව සංස්කෘතික කලාත්මක පැවැත්මේ අලුත් ස්වරූපයක්, ප්‍රභේදයක් ලෙස වර්ධන විය. එය වඩාත් ප්‍රචලිත සංහතික සංශ්ලේෂිය තිරකලාවක් බවට පත්වීමට මූලික සාධක දෙකක් බලපා තිබේ. ඉන් එකක් එක් සාධකයක් වන්නේ සමාජයේ අවශ්‍යතා සහ කාලයේ ඉල්ලීම වන අතර දෙවැනි සාධකය වන්නේ, පෙර බිහිවූ සියලු කලා ප්‍රභේද අත්දැකීමේ නිර්මාණාත්මක පිළිසකර කිරීමේ, උරුමකර ගැනීමේ සහ සංශ්ලේෂණය කරගැනීමේ අද්විතීය හැකියාවයි. 20 වැනි සියවසේ දී මුලින් ම ජාත්‍යන්තර ප්‍රපංචයක් ලෙස ද ඉන්පසුව ගෝලීය ප්‍රපංචයක් ලෙස ද බිහිවූ සංහතික සංස්කෘතියේ ආනන්දනීය කොටසක් බවට සිනමාව පත්විය. එහි ප්‍රතිඵලයක් ලෙස සිනමාව සම්භාව්‍ය බටහිර යුරෝපීය සංස්කෘතියෙන් උරුම කරගත් බුද්ධිමත්, සදාචාරාත්මක, කලාත්මක සහ සෞන්දර්යාත්මක ශක්‍යතාව අභිමි කරගත්තේ ය. මේ අනුව සෑම ජාතික සංස්කෘතියක් තුළ පමණක් නොව ගෝලීය සංස්කෘතිය තුළ ද ජනතාවාදී සිනමාවක් සහ සංහතිකවාදී සිනමා සංස්කෘතියක් වර්ධනය විය.

සිනමාව යනු ලෝකය කලාත්මකව පරාවර්තනය කිරීමේ සහ සෞන්දර්යාත්මක ලෙසින් ප්‍රජානනය කරගැනීමේ නව ප්‍රවේශයක් මිනිසාට උරුම කර දුන් මාධ්‍යයකි. සිනමා කලාව මිනිසා විසින් යථාර්ථය විනිවිද දැකීමේ අලුත් පියවරකි. එය මිනිස් ලෝකය සමග ඇති සම්බන්ධතා ප්‍රසාරණය වීමේ සහ ගැඹුරුවීමේ ප්‍රතිඵලයකි. සිනමාව සමාජ යථාර්ථය අභිසංස්කරණය කිරීමේ, ප්‍රතිනිර්මාණය කිරීමේ මාදිලියක් පමණක් නොව මිනිස් විෂය සෞන්දර්යකරණය කිරීමේ සහ දාර්ශනීකරණය කිරීමේ භාවිතයකි. එය මානව සංහතියේ කලාත්මක විඥානයේ වර්ධනයේ නව රූපාකාරයකි. එසේ ම සිනමා කලාව යථාර්ථය පිළිබඳ කලාත්මක චින්තනයේ නව ගුණයකි. එම නව ගුණාංගය මිනිසා අත්පත් කර ගැනීමේ දී මානව ප්‍රජානනයේ මූලික ස්වරූප ත්‍රිත්වයක වර්ධනය අත්‍යවශ්‍ය ම සාධකයක් වූ බව ඉතිහාසය දෙස බැලීමේ දී පෙනීයයි. විද්‍යාවේ, තාක්ෂණයේ සහ කලාවේ උසස් වර්ධනයෙන් තොරව එම නව ගුණය බිහි විය නොහැකි විය. සංස්ලේෂ ස්වරූපය කලාත්මක චින්තනයේ ස්වරූපයක් වශයෙන් පත්වීමට හැකි වූයේ මිනිසාගේ අධ්‍යාත්මික භාවිතය තුළ ඉහත මානව ප්‍රජානනයේ ප්‍රධාන ස්වරූප ත්‍රිත්වය සංශ්ලේෂීකරණය වීම තුළ පමණ ය. මේ නිසා ලෝක්ය බහුවිධ සංකීර්ණයක් වශයෙන් සංජානනය කරගැනීමටත් යථාර්ථය සමස්තයක් වශයෙන් අවශෝෂණය කරගැනීමටත් හැකියාව ලැබිණි. (වීරසිංහ, 2010)

මිනිසා ස්වභාවධර්මය මත සිය බලය ව්‍යාප්ත කිරීම හා ලෝකය පිළිබඳ සිය අවබෝධය ගැඹුරුවීම විද්‍යා තාක්ෂණික ක්‍රියාවලිය සමග සම්බන්ධව පවතින අතර සිනමාව ද එම දම්වැලේ ම වෙන් කළ නොහැකි එක් පුරුකකි. කලාවේ තාක්ෂණික ශිල්පීය නිරූපණ ශක්‍යතාව තාක්ෂණික ප්‍රගතිය සමග ඉතිහාසයේ සැම කලකම පාහේ සම්බන්ධ වී තිබුණි. විද්‍යාවේ නව සොයාගැනීම් සහ කලාවේ නව අකෘතෘතික වර්ධනයන් යථාර්ථය පිළිබඳ අපගේ ආකල්පයේ සහ අවබෝධයේ සීමා ගැඹුරු කරන්නේ ය. එය ජීවිතයේ නව පැතිකඩ සහ ප්‍රභවයන් හෙළිදරව් කරන අතර ලෝකය පිළිබඳ කලාත්මක පින්තූරයේ නව මානයන් හෙළිකරන්නේ ය. අපගේ කලාත්මක, ආකෘතිකමය, රූපකමය ප්‍රජානනය අඛණ්ඩව ම වර්ධනය වෙමින් ගැඹුරු වන්නේ ය. එය ජාතික සහ විශ්වීය යන අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ අපෝහකාත්මක ක්‍රියාවලියක් තුළ යුගයෙන් යුගයට විවිධ ගුණයන් සහ සම්බන්ධතා ජනනය කරමින් සිදුවන අඛණ්ඩ ක්‍රියාලියකි.

විවිධ මානව සංස්කෘතික සන්තාත්මක අවකාශ තුළට සහ අනන්‍ය වූ මානව සම්බන්ධතා තුළට ගොස් ඒවා සිනමා සංඥාවේ අන්තස්ථ තර්කනයට අනුරූපව අභිසංස්කරණය කිරීමේ සිනමාව සතු හැකියාව නිසා සිනමාව අදාළ සංස්කෘතික සම්ප්‍රදාය තුළ අලුත් අලුත් අදහස්, සංවේදන, අර්ථ, පරමාදර්ශ ආදිය ජනනය කරන්නේ ය. සිනමාව සමාජ යථාර්ථයේ සහ ජීවිතයේ පැවැත්ම හා ගතික දෙස නව මානයකින් නව සම්බන්ධතාවක් හා නව පරාසයක් තුළින් නිරීක්ෂණය කිරීම නිසා මානව ජීවිතය සහ සමාජය පිළිබඳ බහුවිධ අර්ථකථනයන් බිහි කරවයි. මෙය සිනමාවේ සම්භවයේ සිට වර්තමානය දක්වා ම පවතින සුවිශේෂී ගුණයක් වශයෙන් හැඳින්විය හැකි ය. එනම් සිනමාව සමාජය සහ ජීවිතය පිළිබඳ නව දැකීම සහ කියවීම බිහිකරලීමට තුඩු දෙන්නේ ය.

සිනමාව, චිත්‍රය සහ ඡායාරූපයට ආවේණිකව තිබූ කාන්සියෙන් මුදවා ගත් අතර ඊට නව මානයක් හා ජීවයක් දෙන ලදී. ඡායාරූපයේ සම්භවය මානව පරාවර්තනයේ, මානව නිරූපණයේ නව ස්වරූපයක් සනිටුහන් කළ අතර එය මානව පරිකල්පනයේ විශාල ප්‍රදේශයක් සංයෝජනය කිරීමට සමත් විය. සියලු ම දේවල්වට යම් වටිනාකමක්, සුජාත භාවයක් ලැබීමට බලපාන ප්‍රධාන හේතුවක් වන්නේ මිනිස් ආත්මය අදාළ දෙයට මුසු කිරීමයි. විශේෂයෙන් සිනමා ඡායාරූපකරණය බිහිවීමත් සමග ඡායාරූපයට මිනිස් පරිකල්පනයේ සියලු ම මානයන් හා පරාසයන් ආක්‍රමණය කිරීමට හැකියාව ලැබුණේ ය. මෙම කලාව මානව අධ්‍යාත්මයේ සහ යාන්ත්‍රික ඒකාබද්ධතාවේ අද්විතීය ප්‍රතිඵලයකි. (Deleuze : 1983)

සිනමාව ලෝකයේ විවිධ ජාතික සංස්කෘතික සහ සමාජ දාර්ශනික පද්ධති තුළ වර්ධනය වන්නට වූයේ, එම සංස්කෘතීන් පෘෂ්ඨිය මතුපිටින් බාහිරින් ගෙන හැර දැක්වීමේ මාදිලියක් ලෙස පමණක් නොව, අභ්‍යන්තර ගතික සහ විශේෂතා නිරූපණය කිරීම සඳහා වන පෞරාණික නූතනවාදී ප්‍රවේශයක් ලෙස ය. ඊට කැපීපෙනෙන නිදර්ශන ලෙස රුසියානු සිනමාව, ජපන් සිනමාව, ඉන්දීය සිනමාව, ඉරාන සිනමාව ආදිය දැක්විය හැකි ය. බොහෝ යුරෝපීය නොවන සංස්කෘතීන්වලට සිනමාව අදහසක්, සංකල්පයක් ලෙස අල්ලා ගැනීමට අපොහොසත් වූ නිසා සිනමාව සහ අදාළ රටේ ජන ජීවිතය, සංස්කෘතිය, සම්ප්‍රදාය දාර්ශනික අධ්‍යාත්මික චින්තන පද්ධති අතර සිදුවූයේ පෘෂ්ඨීය සහ බාහිරමය සම්බන්ධතාවකි. මෙහි දී වැදගත් වන්නේ සංස්කෘතියේ ලක්ෂණ සහ සංස්කෘතිකාංග සිනමාව සඳහා පාවිච්කිරීම, යොදාගැනීම නොව, සංස්කෘතියේ අභ්‍යන්තරික සද්භාවය සිනමාව තුළ නිරූපණය කිරීම ය. එනම් සිනමාකරුවා කළ යුත්තේ අදාළ ජාතික සංස්කෘතියෙහි අභ්‍යන්තරයට විනිවිද ගොස්, අන්තරීක්ෂ මාදිලියක සිට පරාවර්තනය කිරීමකි. නිරූපණය කිරීමකි. සමකාලීන ශ්‍රී ලාංකේය සිනමාවේ අර්බුදයේ එක් පැතිකඩක් වන්නේ සිනමාව, ජනතාව සමග, සංස්කෘතිය සමග, මානව ද්‍රව්‍ය සමග, අදාළ සමාජ සංස්කෘතික රිද්මය සමග ඇති අසම්බන්ධතාව යි. සිනමාව ජනතාවගෙන් පුදුමාකාර ලෙස දුරස් ය.

ශ්‍රී ලාංකේය සිනමාව තුළ සිනමාව සහ සංස්කෘතිය අතර සම්බන්ධතා ප්‍රධාන ප්‍රවණතා දෙකක් ඔස්සේ සිදුව ඇති බව පෙනේ. සිනමාව මගින් සංස්කෘතිය අභ්‍යන්තරව නිරූපණය කිරීම ඉන් එක්

ප්‍රවණතාවක් වන අතර අනෙක වන්නේ සිනමාව සංස්කෘතිය පාර්ශ්වීයව නිරූපණය කිරීමේ ප්‍රවණතාවයි. 40 දශකය අවසානයේ සිට දශක දෙකක පමණ කාලයක් ශ්‍රී ලාංකේය සිනමාව දකුණු ඉන්දීය සිනමාවේ දැඩි බලපෑම හා ආභාසය යටතේ වර්ධනය වූ අතර පනහ දශකය අවසානයේ ශ්‍රී ලාංකේය සිනමාවේ අනන්‍යතා ලක්ෂණ හැඩගැසීම ආරම්භ වූ බව පැහැදිලි වේ. සිනමාව සංස්කෘතික ප්‍රකාශනයක් ලෙස ශ්‍රී ලාංකේය සිනමාවේ සහ සිනමාකරණයේ ඓතිහාසික විකාශනයේ විශ්ලේෂණ දෙස බැලීමේ දී අප ඉහත ගෙනහැර දැක් වූ ප්‍රධාන ප්‍රවණතා ද්වය දැකගත හැකි ය. සිනමාව අදාළ සංස්කෘතියේ අභ්‍යන්තර ප්‍රකාශනයක් යන සංකල්පය ශ්‍රී ලාංකේය සිනමා චින්තනයේ හා සිනමා භාවිතය තුළ සිනමාත්මක සෞන්දර්ය ප්‍රවණතාවක් ලෙස ප්‍රකට විය. දයානන්ද ගුණවර්ධන, මහගම සේකර, තිස්ස ලියනසූරිය පළමු ප්‍රවණතාවට නිදර්ශන වන අතර ලෙස්ටර් ජේම්ස් පීරිස්, ධර්මසේන පතිරාජ, වසන්ත ඔබේසේකර, ධර්මසිරි බණ්ඩාරනායක ආදීන්ගේ නිර්මාණ දෙවැනි ප්‍රවණතාවට නිදර්ශන වේ.

21 වෙනි සියවසේ සිනමාව පසු වන්නේ අප ගෙනහැර දැක්වූ න්‍යායික, ක්‍රමවේදාත්මක සුසමාදර්ශකයේ පශ්චාත් නූතනවාදී චින්තන මාදිලිය සහ මානව සමාජ පරිණාමයේ උපරි සමාජ තලයේ ය. මේ යුගය වන විට පෙර මානව සමාජ තලයෙහි වූ බොහෝ සම්බන්ධතා ගුණ සහ ආයතන පුළුල් වූද ගැඹුරු වූද විපරිවර්තනයකට ලක් වී තිබේ. මේ මහ විපරිවර්තනය ලොව පුරා ව්‍යාප්තව ජීවත් වන විවිධ මට්ටමේ සහ විවිධ වර්ගයේ වාර්ගික, ජාතික, සංස්කෘතික අනන්‍යතා පද්ධතිවල ඉරණම කෙරෙහි සෘජුව ම බලපාන්නේ ය.

මේ සන්දර්භය තුළ ඒ ඒ ජන වර්ගවලට, ජාතීන්ට ආවේණික වූ උරුම වූ සංස්කෘතික, අධ්‍යාත්මික, බුද්ධිමය ගුණයන් සහ විශේෂතා පවත්වාගෙන යාමේ, සංරක්ෂණය කිරීමේ සංස්කෘතිකාන්තර සහ අන්තර්වර්තී සංස්කෘතික සම්ප්‍රේෂණය කිරීමේ යන්ත්‍රණයක් ලෙස සිනමාව යොදාගැනීම පමණක් නොව සංස්කෘතික වටිනාකම් ප්‍රබුද්ධ අදහස් සෞන්දර්යාත්මක සංවේදන ජනනය කිරීමේ ක්ෂේත්‍රයක් ලෙස සිනමාව නම් නූතන සුසමාදර්ශක මාදිලිය තුළ සහ ගෝලීය උපරි සමාජ පසුබිම තුළ පවත්වාගෙන යාම අනිශ්චිතයකි. (වීරසිංහ 2013).

මෙයට සමගාමීව ශ්‍රී ලාංකේය සිනමා සංස්කෘතියේ සමකාලීන බුද්ධිමය සදාචාරාත්මක, කලාත්මක, නිර්මාණාත්මක සහ සිනමාත්මක, සෞන්දර්යාත්මක දරිද්‍රතාවට බලපා ඇති සාධක ද සොයා බැලිය යුතු ය. එම සාධක අතර ශ්‍රී ලාංකේය සමාජයෙහි, මානසිකත්ව දෘෂ්ටිවාදී පැතිකඩ හැඩගැසීමේ ඓතිහාසික විශේෂතා, ශ්‍රී ලාංකේය සමාජ පාන්තික ස්වභාවයේ සහ ව්‍යුහයේ විශේෂතා, මානසිකත්ව පැතිකඩ නියෝජනය කළ නියෝජිතයන්ගේ බුද්ධිමය හා දාර්ශනික දෘෂ්ටියේ විශේෂතා යටත් විජිතවාදී සහ පශ්චාත් යටත් විජිතවාදී ව්‍යුහයන්ගේ බලපෑමේ සංකීර්ණතා මෙන් ම ශ්‍රී ලාංකේය මානව ද්‍රව්‍යයේ විශේෂතා ද ගෙනහැර දැක්විය හැකි ය.

සමකාලීන මානව වර්ගයාගේ මානසිකත්ව ක්ෂේත්‍රයෙහි උද්ගතව ඇති අප ඉහත ගෙනහැර දක්වන ලද තත්වය තුළ සමාජ සංවර්ධනය, සමාජ පාලනය, රාජ්‍ය පාලනය සහ සමාජ ස්ථාවරත්වය පවත්වා ගෙන යැමේ සාම්ප්‍රදායික, සම්භාව්‍ය හෝ නූතනවාදී විධික්‍රම, ක්‍රමවේද සහ සංකල්පීය මාදිලි උන්මූලමය වශයෙන් අර්බුදයකට ලක්වී ඇති බව පෙන්වා දිය යුතු ය. නිදර්ශනයක් ලෙස පෙර දී බලය සහ පාලනය දරන ලද්දේ සම්පත් හිමි කර ගෙන සිටි පිරිස් වන අතර, අද්‍යතන තත්වය තුළ බලය සහ පාලනය හිමිකර ගෙන සිටින්නේ තොරතුරු, විඥාපන මූලාශ්‍ර සහ තාක්ෂණ හිමි පිරිස් විසිනි. (Toffleft 1980)

මේ අනුව අද්‍යතන ගෝලීය සිනමා සංස්කෘතිය තුළ ජනතාවාදී, ජාතිකවාදී සිනමා රූපයක්, සිනමාවක් ගොඩනගා ගැනීම ක්‍රමික අඛණ්ඩ සහ අභියෝගාත්මක කර්තව්‍යයකි. මෙම අභියෝගය ජය ගැනීම සඳහා න්‍යායික සංකල්පීය වූ ද, දාර්ශනික පදනමක් ඇත්තා වූද, ක්‍රමවේදාත්මක ප්‍රවේශයක් ඇත්තා වූ ද අදහසක්

ලෙස පෞරාණික භූතනවාදී වැඩපිළිවෙළක් මස්සේ ගමන් කළ යුතු බව අපගේ හැඟීමයි. මෙම සංකල්පය තුළ ජාතික හෝ ජනතාවාදී සිනමාවක් නිර්මාණය කරගැනීමේ දී ඉතා වැදගත් වූ ද තේන්ද්‍රිය අර්ථයක් ඇත්තා වූ ද සංකල්පයක් වන්නේ අදාළ සමාජයෙහි මානව ද්‍රව්‍යයට සරිලන ජාතික රූපයක්ගොඩනගාගැනීම යි. සිනමා රූපයේ වැදගත් පැතිකඩ දෙකක් ලෙස තාක්‍ෂණික සංස්ලේෂිත පැතිකඩ සහ නිර්මාණාත්මක ප්‍රභේදාත්මක පැතිකඩ සැලකිය හැකි ය. පළමු පැතිකඩ මගින් අදහස් වන්නේ සිනමාත්මක රූපික භාෂාවේ තාක්‍ෂණය සහ තාක්‍ෂණිකවේදය සම්බන්ධ අංශය වන අතර, දෙවැනි පැතිකඩ මගින් අදහස් වන්නේ යම් සමාජයක් සිය ඓතිහාසික සමාජ සංස්කෘතික පරිණාම ක්‍රියාවලිය තුළ දී අදාළ සමාජයේ මානව ද්‍රව්‍යයට සරිලන ආකාරයට එම මානව ද්‍රව්‍යයේ මූලික ගතිලක්‍ෂණ, ස්වභාවයන් චිත්තස්ථිය, චිත්ත වෘත්තිය ආදී ජනතා සන්තානේ අභ්‍යන්තර ගතික නිරූපණය කිරීම විදහා දැක්වීමේ, ප්‍රකට කිරීමේ, නියෝජනය කිරීමේ, කාලීනව ඉදිරිපත් කිරීමේ මාදිලියක් සිනමා දෘශ්‍ය රූපය තුළ ඒකීය සමස්තයක් ලෙස සංශ්ලේෂණය වී තිබීම යි. මේ අනුව ජාතික සිනමා රූපය යනු අදාළ සමාජයෙහි පුරාණෝක්තික, ආගමික, ආදර්ශනික, කලාත්මක සමාශ්‍රය, සන්නිවේදනය, දෘෂ්ටිවාදී දේශපාලනික ආදී සම්බන්ධතා රාශියකින් උත්පාදනය කරන්නා වූ ගුණ සංකීර්ණයක සංශ්ලේෂණාත්මක වූ ද, අභිසංස්කරණාත්මක වූ ද නිර්මිතියකි.

ශ්‍රී ලාංකේය දෘශ්‍ය සංස්කෘතික ඉතිහාසය තුළ කාලීන දෘශ්‍ය රූපය ප්‍රකට කරගැනීම සහ එය සමකාලීන අවශ්‍යතාවලට සරිලන ආකාරයට අභිසංස්කරණය කරගැනීම සැබෑ ශ්‍රී ලාංකේය ජාතික සිනමාවක් සඳහා අත්‍යවශ්‍ය, මගහැරිය නොහැකි කර්තව්‍යයකි. නමුත් වර්තමාන ශ්‍රී ලාංකේය සිනමා දෘශ්‍ය රූපයේ සැබෑ ස්වරූපය නිරීක්‍ෂණය නොවන්නේ එය සරල වෙළඳපොළ තර්කනයට යටත්ව ක්‍රියාකිරීමත්, සමකාලීන ගෝලීය උපරි සමාජ දෘශ්‍ය සංහතික සංස්කෘතික ගතික හා ප්‍රවණතා මගින් ආක්‍රමණය කර තිබීමත්, ශ්‍රී ලාංකේය ජාතික, රූපික, ශෛලීන්, ආකෘති ස්වරූපය ගවේෂණය කිරීමේ ශාස්ත්‍රාලීය සහ වෘත්තීයවේදී අධ්‍යයනයන් සිදුනොවීමත් නිසා ය.

**ආශ්‍රිත මූලාශ්‍ර**

Deleuze (1983), Cinema, Image motion-1, Image time – 2

වීරසිංහ, විජුධර් (2017), ළමා මානසිකත්වය විපරිවර්තනය කිරීමෙහි ලා සමකාලීන රූපවාහිනිය සමාජ මානසිකත්වය සංස්කෘතියෙහි විප්ලවීය උපකරණයක් ලෙස, විමලධර්ම ප්‍රදීපිකා, ශාස්ත්‍රීය සම්භාෂණ, සංස්: හේරත් මිල්ලෑවේ උපාලි හිමි, සුනිල් ගොඩගේ, මුද්‍රණය එස්. ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්, කොළඹ.

Toffer, A (1980) The Third wave, Bantarn Book. USA

Zinonyew A (1995) West – Phenomen westermism centropoligpap, Moscow

Zinonyew A (2008) Logical Sociology, Moscow Humaniterion university, Moscow

Abel (1998), French Film Theory and Citicism, Prnceton university press, New Jersey

වීරසිංහ, විජුධර් (2010) සිනමාවේ සම්භව, ජාතික චිත්‍රපට සංස්ථාව, කොළඹ.

වීරසිංහ විජුධර් (2013) ගෝලීය සමාජය සහ එහි දෘෂ්ටිවාදය, කෝනැත්ත ප්‍රකාශන ආයතනය, ආණමඩුව.